# OUR ANCIENT COINS

BY


**H. L. CALDERA**

OF

**The Colombo Museum**


---

*[Reprinted from "Vidyodaya" 1937]*

---

# අපේ පැරණි කාසි


කොළඹ කටුගෙයි

ලීලානන්ද කල්දේරයන් විසිනි


---

[1937 "විද්‍යෝදය" සඟ ... නි]

# අපේ පැරණි කාසි.

ඊසුන් වැදූ පිළිවෙත් පුරණ වහන්දෑ නො සෙවිය යුතු වුව ද පොහොසතා පටන් දුගී යාචකයා දක්වා ලොවැ ඇති සියලු දෙනම සැම දෑ එක සේ පතන කාසිය අද කවුරුත් හඳුනති. එහෙත් කාසිය කවර කලෙක කුමක් සඳහා කෙසේ නිපැණිණිදැ යි නො දන්නෝ ටිකදෙනෙක් නො වෙති. එබැවින් කාගේත් සිත් ඊට යොමු කැරවීම වටිනා සංග්‍රහයකැයි සිතූ අපි මේ ලිපිය ලිවීමෙහි පෙරටු වූමු. කාසියේ ඉතිහාසය පිරියෙස්නා කල එහි දසා කීප යක් පවතින බව පෙනී යේ.

අති පුරාණයෙහි වුසූ ජනයා ඔවුන්ගේ කෑම්, පීම්, ඉඳුම්, හිටුම් ආදී දිවි පෙවෙත රැකැ ගැනීමට අවශ්‍ය වූ දේවල් උපයා ගත නො හැකි වූ විට නොහොත් සෑහෙන පමණ උපයා ගත නො හැකි වූ විට ඒවා පිටතින් ද ලබාගන්නට සිතූහ. මේ නිසා ගනුදෙනු ක්‍රමයක් ඇතිකර ගන්නට ඔවුනට වුවමනා විය. දූනුදූ අප්‍රිකා අමෙරිකාදී රටවලැ සභ්‍යත්වයට නො පත් ජනයා යම් යම් දේ හුවමාරුකර ගැනීමෙන් තමන් තමන්ගේ නො එක් අඩු ලුහුඬුකම් පුරවා ගැනීමත් ලක්දිවැ වැදි ජනයා තමන් වසන අඩවිවලැ සුලභව ලැබෙන මී පැණි, මී ඉටි, අං, ලුණුමස් ආදිය අසල ගැමුන්ගේ ඊතල, ලුණු, රෙදිපිළි ආදී ද්‍රව්‍යයනට මාරුකර ගැනීමයි පෙරැ පැවැති ඒ සිරිත අපට සිහි කරවයි. මිල ක්‍රමයක් ඇතිකර ගැනීමෙන් කානටත් පහසු වෙන් ගනුදෙනු කළ හැකි බව සැලැකූ ඔවුහු හම්කැබැලි, සිප්පි, පබළු, කවඩි යනාදිය මුදල් මෙන් භාවිත කරන්නට පටන් ගත්හ. මෙම අවදානම් මුදල් ක්‍රමය ලොහ වගී දූත ගැනීමත් සමගම ක්‍රම යෙන් අතුරුදන් වන්නට පටන් ගැනිණ. පොළොවින් හාරාගත් වනම තළා කපා ගත් ලොහෝ කැබැලි කාසි මෙන් භාවිතයට පැමි ණෙන්නට ද වියැ. පසු වැ උවිතාකම් දක්වන අඩයන් ද ඒ ඒ නරපතීන්ගේ රූ සටහන් ද තගා ඒවා හඳුන්වන්නට ද පටන් ගත්හ.

අපේ ඉතිහාසය ආරම්භවනුයේ විජය රජුගෙනි. එ සමයේ මේ රටට හිමි වූ කාසියක් පැවැති බව කියැවෙන සඳකුණෙක් නැත ද ඉන්දියාවෙන් පැමිණි විජයාදීන් එකල ඉන්දියාවෙහි පැවැති මුදල් වගී මෙහිදී ද භාවිත කරන්නට ඇතැ යි සිතිය යුතුය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

ආදි කොට ම මහාවංශයේ මුදල් ගැන සඳහන් වනුයේ සිව්වන පරිච්ඡේදයෙහි එන වැදෑරට භික්ෂූන් පිළිබඳ පුවතෙක යැ. මහාවංශ ටීකා පස්වන පරිච්ඡේදය 'චාණක්‍යයන් එක එක කහවුණින් අටක් අටක්බැගින් තිමා කහවණු අසූකෝටියක් රැස්කළ බව'කියයි. කහාපණ යන වචනය මහාවංශයෙහි පළමු කොට දකින්නට ලැබෙන්නේ xxi වන පරිච්ඡේදයෙහි එළාර රජුගේ සෑගිරි ගමනක් පිළිබඳව එන පුවතෙහිය. දුටුගැමුණු රජු කැලි විදමන්හි සුරු වූසභදෙව යොධය නට කෙළින් සිටැ වූ ඊයෙක පගිළිය වැසෙන සේ කහවණු ගොඩ කරවා දුන් බව හා එසේම රුවන්මැලි මහසෑයේ සැලැස්ම ඇදි අය ටත් ලෝවාමහාපායේ වැඩ කළ කම්කරුවනටත් වැටුප් පිණිස කහ වණුදුන් බවක් හා මහාවංශය කියයි. සිංහල රජුන් ආගමික කට යුතු සඳහා නොයෙක් පුඩුවෙන් කහවණු වියදම් කළ බව දක්වන සෙල්ලිපි ද වෙති. ඉතා ම වැඩි ගණන සටහන් වන්නේ වසභ රජු පිළිබඳ සෙල්ලිපියක ය. එහි දැක්වෙන ගණන ලක්ෂයකි. 'පාදයක් සොරකම් කළ මහණ පරාජිකා වන බව බුදුන් වදාළහ'යි බුදුඝොෂ හිමියන් කළ විනය අටුවායෙහි එයි. එකල රජගහනුවර මාෂක හෙවත් මසු පහක් පාදයක් යි නියම වැ තුබුණු හෙයින් කහවණු වක මිලට මසුවලින් නම් විස්සක් සම වූ බව් මෙයින් වටහා ගත හැක.


## රිදී කහාපණ

---

ඉන්දියාවෙන් හා ලංකාවෙන් හා සොයාගත් ඉපැරැණි කාසිය කහාපණය යැ. මෙය කර්ෂාපණ ය පුරාණ ය ධරණ ය සාලක ය ආදි නවද නම් වලින් හඳුන්වනු ලැබෙයි. මුළු කහාපණය 'ග්‍රෙන්ස්' 56 ක් ද, කෝන නම් වූ අඩ කහාපණය 'ග්‍රෙන්ස්' 28 ක් ද, තන්බා හෙවත් පදිකා නම් වූ අඩින් අඩ කහාපණය 'ග්‍රෙන්ස්' 14 ක් ද බර ය.

රිදී පොලු තළා සම බරව ද එක පමණව ද සිටින සේ කපා සෑදූ මෙම කාසියෙහි උඩු පැත්තෙහි එතරම් ඝන සැරේට ලකුණු ඇති බවක් නො පැනේ. සමහර කාසියක එක ලකුණකට වඩා නැත. ඕනෑම කෙනකුට මෙම කාසිය සෑදීමට රජයෙන් තහනමක් නො වීය යෙති. එය එසේ වුව ද අපරට ධාන්‍ය මනින බුසල් සේරු ආදියෙහි ආංඩුවෙන් මුද්‍රා තබන්නා සේ කවුරුත් තම තමා නිපදවාගත් කාසිවල බර පිරිසුදුකම ආදිය සුදුසුය යි රජයෙන් සහතික කරවා ගත යුතු වියැ. කාසිය රජයෙන් පිළිගැනිණි නම්

කාසිය යටපැත්තෙහි මුද්‍රාවක් කෙරෙයි. කල් යත් යත් එක් එක් අයගේ අතට පත්වූ විට ඔවුනොවුන්ගේ හිමිකම් දක්වන රහස් ලකුණු ද කාසිය උඩු පැත්තේ සටහන් කෙරෙන්නට විය. එහෙයින් උඩුපැත්තෙහි ලකුණු ගණන බොහෝ වෙයි. ලකුණු 20 දක්වා සට හන්කාසි ද ඇති. ලංකාවෙහි සම්භ වූ කාසිවලැ මෙ කියන සලකුණු නැති වීමත් මෙ රටට ම විශෙෂ වූ බෞද්ධ ස්වස්තික ලකුණ නැති වීමත් එම කාසි භාරත දෙශයට අයිති ඒවාය යි සිතන්නට කාරණයෙකි. කණු සතරක් පිරිවර කොට ඇති කණුවක් මතැ පිහිටි සේ දක්වෙන ස්වස්තිකය **බෞද්ධ ස්වස්තිකය** යැ. දුටුගැමුණුවන් සොහොවුරු සැද්ධාතිස් රජු දඹුළු ලෙනෙහි කරැ වූ සෙල්ලිපියක අවසානයෙහි හා වළගම්බා රජු ගල්ලෙන විහාරයෙහි කැරැ වූ සෙල්ලිපියක හා පැනෙන මෙම ඉපැරැණි සලකුණ වෙසෙසින් සැලැකිය යුත්තෙකි.



රිදී කහාපණය
(ආදියේ සිට 10 වන ශතවර්ෂය පමණ වනතුරු.)

සිව්රැස් ය ඔවාලය යි මෙම කාසි දෙවගයෙකි. ඒ එකක් එකක් ඝන ය තුනී යයි නැවැත ද දෙකකට බෙදෙයි. ඒවායෙහි එකින් එක වෙනස් වෙනස් ලකුණු පන්සියයක් පමණ ඇති බව මේවන තුරු කැරුණු පිරියෙසුන්වලින් තීරණය කළ හැක. රස් විදෙන ඉර, චන්ද්‍රයා, බල්ලා, ඇතා, ගොනා, මසු, ගහ යන මේය ඒ අතරෙහි සුලභව දකින්නට ලැබෙන සලකුණු. කසුබ් රජු කැරැ වූ බෝ උපුල්වන් වෙහෙර පසින් වැසුණු පියගැටයක් මතැ තිබී රිදී කහාපණ 70 ක් මෑත දී අනාවරණය විය. සිව්වන මිහිඳු රජු (975-991) න් එ වෙහෙරට පිදූ ගම්වරක් ගැන කියන සෙල්ලිපියක් ද එහි වූ බැවින් එම රිදී කහාපණ දූරාතීතයේ සිට ක්‍රි: ව: 1000 දක්වා භාවිත විණැයි අනුමාන කළ හැකිය.

## බෞද්ධ ස්වස්තික කාසි

ඒ අතර වෙනත් කාසි ද නො වූයේ නො වේ. නො බෝ කලකට පෙර අතිකක් මැවීමෙන් අතුරැ දහන්වුණු අපේ පරණ සතපහේ තඹකාසිය පමණැති **බෞද්ධ ස්වස්තික තඹකාසිය** ඉන් එකකි. එහි එක් පැත්තක බෞද්ධ ස්වස්තිකයක් ද, තුන්කොන්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

සටහනක් ද, ගමන්කරන ලීලාවක් දක්වෙන ඇත් රුවක් ද, අඩසඳ ලකුණු තුනකින් සැලැසුණු දාගැබ් සටහනක් ද, සතරැස් කොටුවක් සහිත අතු තුනකින් යුත් බෝගසක් ද වෙයි. අනින් පැත්තෙහි බෞද්ධ සවස්තිකය හා එකට බැඳුණු තුන් කොන් සටහන් දෙකක් ද, තුන් තවයකින් සැලැසුණු දාගැබ් සටහනක් ද තිසුලවී සටහනක් ද වෙයි. හැම කාසියක ම මෙම සලකුණු නො අඩු වැ තිබිය යුතු වුව ද කාසි කරන්නන් ගේ සිහිති දැනීමේ වරදින් ඒ ලකුණු එක සේ වැදී නො මැත.

මඟුල් ලකුණක් වූ සවස්තිකය භාරතයෙහි ද කාසිවල හා නොයෙක් කැටයම්වල හා දකින්නට ලැබේ. අද ජරමනියේ රාජමුද්‍රාව වශයෙන් පිළිගෙන තිබෙන්නේ ද එය යැ. එහෙත් බෞද්ධ සවස්තික ලකුණ අප රටෙහි විනා ඇති බවක් නො පැනේ. එහෙයින් එය අපට ම වෙසෙසුනක් යයි සිතනු යෙදේ. මේ රටට ම හිමි කාසි හැඳින ගැනීමට ඒ ඉමහත් වහලෙකි. මෙම ලකුණු අතරැ වූ තිසුලවියෙන් කුමක් අදහස් කෙරෙත් ද යි පැහැදිලි නො වෙතත් අනින් හැම ලකුණක්ම මඟුල් ලකුණක් වන හෙයින් එද මඟුල් ලකුණක් සේ ගැනීම නො මැනවි නොවේ යයි සිතමු.




බෞද්ධ සවස්තික කාසිය
(3-7 වන ශතවර්‍ෂ)

ඒ කාසිය 4–7 වන ශතවර්‍ෂවලට අයත් පුරාවස්තූන්හි තිබී සම්භවී තිබෙන හෙයින් එ සමය දක්වා එය වැහැර විණැයි සිතිය හැකි. කිසි ද අකුරක් සටහන් නොවැ තිබීම කාලය සීමා කොට දැක්වීමට බාධා කෙරෙයි. හවුරුදු 55 කට පමණ පෙරැ තිස්සමහාරාමයෙන් **හෑන්ජිපාකර්** මහතා පළමුවරට මෙම වර්ගයේ කාසියක් සොයා ගති. ඉන්පසු අභයගිරිය, මාන්තෝට්ටම යනාදී කීපතැනකින් ද සොයාගන්නට හැකි විය. 'ග්‍රෙන්ස්' 242 ක් පමණ බරැති ඊට ද්විපණ නම් නාමයක් ද වෙයි.

හතරැස් වූ හෝ වටකුරු වූ හෝ **අක්ෂර** නම් තවද කාසියක් යටැකී කාසි හා එකට හැසිරිණ. උඩපැත්තේ සිංහ රුවක් හා යට පැත්තේ බින්දු සතරක් හා දැක්වෙන එම කාසිවර්ගය අනුරාධපුර ජේතවන, අභයගිරි, කිරිබත් යන දාගැබ්වලින් හා එළාර සොහොන සමීපයෙන් හා උතුරේ කන්තරෝදය තිරුකෙතීශ්වරම යන නටබුන් නගරවලින් හා ලැබිණ. ඒ තුන්වන ශතවර්ෂයේදී පමණ භාවිත විණැයි සිතිය හැකි. ස්වස්තිකයත් සමග අසකුගේ හා බෝරුකක හා සටහන වූ ද සිංහයකුගේ හා දාගබක සටහන වූ ද බෝරුකක සටහන වූ ද ගොනකුගේ සටහන වූ දැයි තවද තඹකාසි කීපයක් යටැකී කාසි සමයෙහිම අප්‍රකටව පැවැතිණ. බරින් ඒවා එකකට එකක් අසමාන යැ.

## ලක්ෂ්මී කාසි

**පලාක්ස්** නම් වූ වාත්තු කළ කාසියක් ද තඹ තහඩුවල අච්චු ගැසුණු කාසියක් ද අනතුරු සමයට වැටේ. අඟල් $1\frac{1}{4}$ ක් දිග හා අඟල් $\frac{1}{2}$ ක් පළල හා ඇති වාත්තු කළ කාසියෙහි සියයට 60 ක් පමණ ඊයම් ද 15 ක් පමණ තඹ ද මුසු යැ. මනා වැ සටහන් පෙනෙන මෙම කාසිය උඩපැත්තෙහි නෙළුම් මලක් මත සිටුනා ලක්ෂ්මී රුවක් ද යටපැත්තෙහි බෞද්ධ ස්වස්තිකය ද වෙයි. බොහෝ කාසිවලට චතුර කළසක හා ගොනකුගේ හා සටහන් වැඩිපුර ඇතුළු වැ තිබේ. 'ග්‍රෙන්ස්' 65 සිට 129 දක්වා අ සමානව කිරෙන මෙය වෙන් වෙන් වැ සැදුණු දෙ පලුවක් එකට පැස්සීමෙන් නිමකර තිබෙන්නකි. තහඩුකාසිය තුනී වුව ද සවිය යැ. මුව හත් යැ. දිග අඟල් $1\frac{3}{4}$ ක් පමණ යැ. පළල $\frac{1}{4}$ ක් පමණ යැ මේ වර්ගයේ සටහන් පැහැදිලි කාසියක් සොයා ගැනීම සුකර නො වේ. ලක්ෂ්මී වෙනුවට උක්කුටුකයෙන් හිඳුනා මිනිස් රුවක් ද



ලක්ෂ්මී කාසිය
(4–12 වන ශත වර්ෂ)

සමහරෙක වෙයි. බර 'ග්‍රෙන්ස්' 20 පටන් 60 දක්වා යැ. තහඩු කාසිය 1884 දී පාකර් මහතා විසින් ද, වාත්තු කළ කාසිය 1902 දී **ජෝන් ස්ටිල් මහතා** විසින් ද පළමුවරට සොයා ගන්නාලදී. පොළොන්නරුවේ ජේතවනාරාම නෂ්ටාවශිෂ්ටයන් අතරින් මේ

වර්ගයේ කාසි සොයාගත හැකි වීම දොළොස්වන ශතවර්ෂය වනතුරුම එම කාසි භාවිත වියැ යි නිගමනය කිරීමට සාක්ෂ්‍යයකි. මේවා කාසි වර්ගයක් නොව **'මාලපෙති විශෙෂයක්'**යි විශෙෂඥයන් අතර මත භේදයෙක් ද වෙයි. ඊට හේතුව වනුයේ කාසි බොහොමයක් සිදුරක් සහිතව මාලපෙත්තක් සේ නිමවා තිබීම යැ.

## රෝමන් කාසි

රෝමන් කාසියක් තෙවන ශතවර්ෂයේ සිට හවන ශතවර්ෂය දක්වාම මෙ රටෙහි බහුලව භාවිත විණ. මුහුදු කාරෙහි හා කඳුකරෙහි හා කීප තැනක් හැර ලඞකාවෙහි බොහෝ පළාත් වලින් අනාවරණය වූ හෙයින් එය ලක හැම තැනම වාගේ බහුල වශයෙන් ප්‍රචාරිත වියැ යි කිය හැකිය. සීගිරි බලකොටුවෙන් ලැබුණු පැරණි කාසිවලින් සියයට 99 ක් ම රෝමන් කාසි විය. රෝමන් කාසිය කසුප් රජු සමයෙහි අග්‍රස්ථානයෙහි ලා සැලැකිණැ යි ද රෝමන් අධිරාජ්‍යය හා මෙරට හා අතර වෙළඳාම බහුලව පැවැතිණැ යි ද සිතීමට එය බලවත් සාධකයකි. ලංකා ඉතිහාස යෙහි මූලාරම්භයේ සිට 11 වන ශතවර්ෂය දක්වා භාවිත වූ කාසි අතුරින් කාලය නියම ලෙස දක් විය හැකි එකම කාසිය ද මේ යැ. අධිරාජයාගේ උඩුකය රූ සට හනත් ඉංග්‍රිසි අකුරින් ඔහුගේ නමත් එහි උඩුපැත්තේ නගා තිබේ. යටිපැත්තේ භේවායකු සහිතව එක් එක් රජුට අභිමත ලෙසට යෙදූ වූ නා නා රූ සටහන් යැ. 4-5 වන ශතවර්ෂවලට අයත් තඹකාසි බොහෝ ලැබීමත් රන් රිදී කාසි දුරාචාරයකින් ලැබීමත් නිසා වැඩි වශයෙන් එකල තඹකාසි භාවිත වියැ යි සිතිය හැකිය. රාෂ්ට්‍රවිප්ලවාදී පීඩායෙන් තො මිදී පැවැති හෙයින් 6-11 වන ශතවර්ෂවල තුබුණු රන්කාසි උණුකර අන් ලෙසකින් ප්‍රයෝජන ගැනීමත් බඩු හුවමාරුවෙන් බොහෝ සෙයින් ගණුදෙනු පිරිමසා ගැනීමත් ඊට කරුණු වූ බව මෙහි ලා සැලැකිය යුතුය.



රෝමන් කාසිය

(3-6 වන ශතවර්ෂ)

මාතරට නුදුරු තාවිමතැ නිධානයකින් රෝමන් කාසියට අදාළ වැ සැදුණු කාසි තොගයක් සම්භ විය. ඒ අනුව එකල රෝමන් කාසිය බහුලව භාවිත විණැ යි ද එහෙයින් හොර කාසි නො අඩුව ඇති විණැ යි ද සිතන්නට පිළිවන.

# මධ්‍යම යුගයේ බර මිනුම් ක්‍රම

ධම්මපිය අටුවාවෙහි වාහිස වස්තුයෙහි එන "හිරඤ්ඤසුවණ්ණස්ස" යන පාඨයට ගැටපද විවරණය කළ කාශ්‍යප රජතුමෝ (929-939) 'හිරඤ්ඤ නම් කහවණු, සුවණ්ණ නම් රත්රන්' යි අර්ථ කීහු. මහාවංශයෙහි 48 වන පරිච්ඡේදයෙහි "රජතෙම (v අග්බෝ ක්‍රි. ව. 726-732) රන් සවිසි දහසක් නිමවා සෑගිරියෙහි ජරාවට පැමිණි තැන් නවකම් කෙළේය"යි ද ii මිහිඳු එහිම (අභය ගිරියෙහි) ධුත්ලක්ෂයකින් නො යෙක් මහල් ඇති කොට අන්‍ය වූ වෛජයන්ත ප්‍රාසාදයක් මෙන් ඉතා මනොඥ රත්න ප්‍රාසාදය කරවා මහත් ධන ඇත්තා වූ රජතෙම ජම්බෝනද රන් සැටදහසකින් අනර්ඝ චූඩාමාණික්‍ය යුක්ත කොට"යි ද සඳහන්වැ තිබේ. මේ පාඨ මහාවංසයෙහි තන්හි තන්හි එන රන් ගණන් දක්වෙන තවද පාඨ හා ගෙන සලකා බලන කල්හි සියලු තන්හිම දක්වෙන රන් ගණන් නො තැළරතින්ම ගත් බව පැහැදිලි වෙයි.

මිහින්තලේ දෙවන සේන රජුගේ සෙල්ලිපියෙහි ඒ ඒ ධුරවලට ගෙවිය යුතු රන් කළන් ගණනින් ප්‍රමාණ කොට තිබේ. **මොග්ගල්ලාන අභිධානප්පදීපිකාව** වී ඇට 160 ක බර හෙවත් අට අකක් ධරණයෙකැ යි කියයි. දකුණු ඉන්දියාවේ 1 වන රාජරාජ රජුගේ **තන්ජෝරු ශිලා ලිපියක්** එම බර මංචාඩි 20 ක් හෙවත් කළඳක් බව කියයි. සිංහල සෙල්ලිපිවල ධරණය හා කළඳ හා නො වෙනස් සේ යෙදුණු බවත් කළඳ හා අක එකම සෙල්ලිපියෙහි යෙදී ඇති බවත් පෑනේ. අනුරාධපුර කෞතුකාගාරයෙහි තිබෙන පස්වන දප්පුළුසෙන් රජුගේ වෙස්සගිරි ශිලා ලිපිය මෙහි ලා නිදසුනක් සේ ඇරැ පෑ හැකිය. බුද්ධනාග තෙරුන්වහන්සේ විනය රත්ථමඤ්ජුසා වෙන් "මාසකයක් පුරාණ කහාපණයකින් 1/20 කොටසක් ය. එය මංචාඩි නාමයෙන් වහර තී"යි පළ කරන සේක. එයින් කහාපණය කින් 1/20 ක්වූ මාසකයේත් මංචාඩියේත් අගයෙහි වෙනසක් නොවූ බව ද හෙළි වෙයි.

බුදුගොස් හිමියන් කළ සම න්තපාසාදිකාවෙහි එන "කහාපණ යකින් $\frac{1}{4}$ ක් හෙවත් පාදයක් සොරකම් කළ මහණ තෙම පරිජිවේ"යි දක්වෙන පාඨයට අර්ථ දක්වන ශාරිපුත්‍ර තෙරුන්වහන්සේගේ ශිෂ්‍ය දිඹුලාගල මෙධඞ්කර සංඝරක්ඛිත ස්වාමීහු "එකල රජගහ නුවර පස් මඳටෙක් පලෙක් වී යැ"යි විනය සන්නයෙහි සඳහන් කළහ. පල් පොහොනා වතක් යන පාඨයට අර්ථ දක්වන මූල්සිකා

ගැටපද විවරණ කතුතුමෝ "පාරාජිකා පොහොනා වසතුවක්...... ......සී" සඳහන් කළහ. මෙම සියල්ල කැටි කොට මෙතෙහි ලා බලන විට පලය දෙ අකකට සම වූ බවත් මාසකය හා මංචාඩිය හා එක සම බවත් මාසක 20 ක් බරැති කහාපණය හා මදටිය 20 ක් හෙවත් අට අකක් බරැති කහවණුව හා අතරෙහි බරින් මඳ වූ ද වෙනසෙක් නො මැති වූ බවත් යන අදහස් වැලක් පහළ වෙයි.

## කහවණුව

ක්‍රි. වර්‍ෂය ආරම්භයේ සිටම කහවණුව හෙවත් කහාපණය සෙල්ලිපිවලත් මහාවංසයේත් දක්වෙතුදු මධ්‍යම යුගයේ ලාංකෙය කාසියක් ගැන පළමුවෙන්ම සඳහන්වන්නේ 7-8 වන ශතවර්‍ෂයට අයත් දමිළ සෙල්ලිපියකය. "..............ගෙන් **ඉලක්කාසු** තිහක් ලදිමු"යන අදහස එහි සඳහන් වෙයි. දෙමළයෙහි ඉලම්ඛො යනු ලංකාවට නම්. කාසි යනු මිලයට නම්. එහෙයින් ඉලම්ඛොය කාසු යන වචන දෙකේ සමායොගයෙන් ඉලක්කාසු යි කියා ගෙන ලංකාවේ කාසි හැඳිනැවුණු සේ සිතා ගත යුතු වේ.

කහවණුව ය අඩකහවණුව ය පලය ය අකය යැයි කාසි සතරෙකි. කහවණුවේ සහෝදරයන් වූ පසු වැ කී කාසි එකක් එකක් ඊට මුලින් නම් ඇති කාසියෙන් අඩකින් කුඩා වෙයි. කහවණුව 'ග්‍රෙන්ස්' 68-70 ක් බර ය. උඩපැත්තේ සිටුනා මිනිස් රුවකි. එහි දෙපසෙහි වූ මඳක් වක් ඉරි දෙකකින් 'ධොටියක්' හැඳ සිටින සෙයක් දක් වේ. උඩුකුරු කොට ගත් වමතින් නෙළුම් කැකුළක් ද සකක් හෝ වෙනයම් දෙයක් ද මුහුණ දෙසට ඇලවන සේ අල්ලා ගෙන සිටී. අනිත් අත පහත හෙළා ගෙන සිටී. ඊට කුඩුරින් ත්‍රිශූලයක් වැනි සටහන් දෙකක් වෙයි. එය ජය කොතතයත් චාමරයත් යි සී. ඇම්. ප්‍රනාන්දු මහතා කියයි. රජුගේ ආගම භක්තිය පළකිරීමට යෙදුණු බිම තබතලද පහනක හා එල් ලන පහනක හා සටහන් යයි **කොඩ්රිංටන් මහතා** කියයි. මහාපරාක්‍රමබාහුරජුගේ බිසොව පොළොන්නරුවෙහි පොත්ගුල් වෙහෙර කරවූ බව දක්වෙන



රන් කහවණුව

(9-10 වන ශත වර්‍ෂ)

පාලි භාෂාමය සෙල්ලිපියෙහි 8 වන පෙළ අවසානයෙහි ද **ජී. ජේ. රැප්සන් මහතුන්** භාරතයේ පැරණි කාසි පිළිබඳ ලියූ පොතෙහි දක්වෙන පාංචාල දෙශීය කාසියක ද මෙවැනි සටහන් හතරක් හෝ පහක් හෝ දකින්නට ලැබේ. එය පොහෝ දින හඟ වන්නකැ යි මතයක් පවතිනත් අව පුර හෙදයක් ඉන් නොහැඟෙන හෙයින් ඒ මතය සනාථ සේ පිළිගැනීමට ඉඩෙක් නැති. කාසියේ යට පැත්තෙහි දිගටත් සරසටත් ගිය ඉරි කිපයකින් දක්වෙන ආසන යක් මතුයෙහි උක්කුටුකයෙන් හිඳුනා මිනිස් රුවකි. එහි ද උඩුකුරු කොට ගත් වමත උඩපැත්තේ සටහනේ සේ යැ. රූපයට දකුණු පසැ නාගර අකුරු කීපයක් වෙති. ඒවායේ නො පැහැදිලිකම නිසා විශෙෂඥයෝ කලින් කල නොයෙක් අරුත් පළ කෙරෙති. **ලංකෙශ්වර** යනු ඔවුන් දෙන එක් අරුතකි. මීට සම වූ ලංකිස්සර යන පාලි ශබ්දය දාඨාවංසයේ V වන පරිච්ඡෙදයේ 343 වන ගාථා වෙහි මහාසේන රජු සඳහා ද 405 වන ගාථායෙහි කීර්ති ශ්‍රී මෙඝ වර්ණ රජු සඳහා ද පළමුවන විජයබාහු රජු සඳහා ද 76 වන පරිච්ඡෙදයෙහි පරාක්‍රමබාහු රජු සඳහා ද යොදා තිබෙන බව පෙනේ. පොළොන්නරුවෙන් ගෙනැවිත් දැනට කොළඹ කටුගෙයි ප්‍රදර්ශන යට තබා තිබෙන නිශ්ශඞ්ක මල්ලයන්ගේ සෙල්මුවා සිංහාසනයෙහි **ශ්‍රී වීර දුරාජවීර වෙශ්‍යාභුජඞ්ග නිශ්ශඞ්ක ලංකෙශ්වර** .........යි කොටා තිබේ. දඹුල්ලේ ශිලාලෙඛනයෙහි "අප්‍රතිමල්ල නිශ්ශංක කාලිඞ්ග ලංකෙශ්වර පරාක්‍රමබාහු" යයි නිශ්ශඞ්ක මල්ලරජු ද ලඞ්කෙශ්වර නමින් හැඳිනි බව් පෙනේ. මේ කරුණු යටකී මතය හා උරින් උරදී සිටී. "ලංකාවිභ" නොහොත් **ලංකාවෙභෙ** යනු ද **ලංකාසිංහ** යනු ද තවත් තේරුම් දෙකකි. මේ එකද අර්ථයක් සැකයෙන් තොර කොට දක්විය නො හැකි යයි කියන කොඩ්රිංටන් මහතා පසුවැ කී තේරුම **ලංකාවිභූ** විය යුතු යයි අන් ලෙසකින් තෝරයි. එය පිළිගත යුතු යයි අපට ද සිතේ. මුල් කාලයෙහි අදහස් ප්‍රකාශ කරන්නවුනට වඩා සමනා බැලීමට අදහස් කීපයක් හා කාසි බොහොමයක් හා ලැබෙන බැවිනි. මෙම කාසි වර්ගයේ සටහන් රූපය ගැන ද මත හෙදයක් පවතී. කාසිවෙට්ටි මහතා ඒ පිළිබඳ විවෙචනයක් කරමින් උඩපැත්තේ වනුයේ විෂ්ණු රූපය බවත් යටපැත්තේ වනුයේ හනුමා රූපය බවත් එය 'පේයි' කාසි හෙවත් යක්ෂ කාසිය යි ද, 'පෙයිප් පෙරුමන්' කාසිය හෙවත් යක්ෂ රජුගේ කාසිය යි ද, රාවණා කාසිය යි ද කියා අඳුන්වනු ලබන බවත් කියයි. ලංකාවට ද්‍රෝහකම් කළ වානරයාගේ රූපය සිංහල රජ වරුන් එ තරම් සම්භාවනයෙන් පිළිගතුදැ යි මෙහිදී සැක කළ යුතුව තිබේ. නෙළුම් මල හා සකෙහි හා සම්බන්ධය නිසා රූපය විෂ්ණුනුගේ

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

යයි කරන නිගමනය, එහි අත් දෙකක් පමණක් දක්වෙන බැවින් අසරණ වෙයි. එහෙයින් එය විෂ්ණුහුගේ අවතාරයක් වන රාමාගේ රූපය විය හැකි යයි කොඩ්රිංටන් මහතා අන් ලෙසකට හරවයි. රජ රුවක් යයි නිගමනය කරන සී. ඇම්. ප්‍රනාන්දු, රීස් ඩේවිස් යන මහතුන් අතර හිස වැසුම පිළිබඳ පවතින අදහස් වෙනස් ය. හිස පිටිපසැ ඉරි කැබැලි දෙකින් පෙන්නුම් කැරෙන්නේ කොණ්ඩය යයි ප්‍රකාශ කරන සී ඇම්. ප්‍රනාන්දු මහතා ඉතිහාසයෙන් ද කරුණු ඇරැ දක්වමින් සිංහල රජවරු කොණ්ඩය බැන්දහ යි තීරණය කිරීමට ඒ රුකුලක් කර ගතියි. මේ මත කෙසේ වෙතත් ලීලාවතී බිසොවුන්ගේ තඹකාසිවල ද එක සේ සටහන් වන මෙම හිසවැස්ම අනුරාධපුර ඉසුරුමුනි විහාරයේ නෙලා තිබෙන හත් වන ශතවර්ෂයට අයත් අසරු රූපයේ හිසවැස්මට බෙහෙවින් සමාන බව කිව යුතුය. යටපැත්තේ උක්කුටුකයෙන් හිඳුනා රූපය කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනයට තබා තිබෙන ක්‍රිස්තුවර්ෂයෙන් යට තුන් වන ශතවර්ෂයට අයත් යටාල දාගැබින් ලැබී තිබෙන මුද්‍රාවෙහි රූපය හා පේරාදෙණිය අසල හිඳගල විහාරයේ ඇඳ තිබෙන බුදුරජුන් විජම් දෙසීම දක්වන චිත්‍රයෙහි මාතෘ දිව්‍යරජ රූපය හා එක් වන්ය.

## කහවණුවේ ප්‍රභෙද

මතු පිට නගා තිබෙන සටහන් අනුව කහවණුව සහ සොහොවුරු කාසින් කොටස් නවයකට බෙදා දක්වන හැක i සූර්‍යයා සහ චන්ද්‍රයා ii කුසලාන iii නෙළුම් මල සහ අඩසඳ iv අඩසඳ සහ නෙළුම් මල v නෙළුම් මල් යුවළ vi අඩසඳ යුවළ vii පිච්ච කැකුළු සහ නෙළුම් මල viii ගෝලය සහ වළල්ල ix පිච්චමල සහ හක් ගෙඩිය ද යන විසිති. මේවායේ සටහන්වලත් අකුරුවලත් අසමානකම් පැවැතීම රජුන් කීප දෙනකුන් විසින් නිකුත් කරණලද බවට සාක්ෂ්‍ය යකි. අඩකහවණුව ග්‍රෙන්ස් 33 ක් කිරෙයි. එහි උඩුපැත්තෙහි කහවණු වෙහි මෙන් ම හිඳුනා රූපය වෙයි යට පැත්තෙහි ශ්‍රී ලඞ්කා යන අකුරු වෙයි. 'කා' අක්ෂරයට යට නවද ක' අක්ෂරයක් තිබෙන බැවින් මුල් කාසිය එය යයි කොඩ්රිංටන් මහතා අනුමාන කරයි. පුස්කොළ පොත්වලැ පිටු අඞ්ක



පලශ හෙවත් දෙ අක

(10-11 ශතවර්ෂ)

බොහෝ සෙයින් 'ක' යන්නෙන් ඇරඹෑ තිබීමේ සිරිත රුකුලක් කර ගැනීමෙනි. ඒ මතය පිළිගත හොත් කහවණුව ද්විකහ වණුව සේ ගත යුතු වේ. ප්‍රතිකාල් සමයේ පැවැතුණු තංගම හා ද්විතංගම හා මෙනි. එහෙත් ද්විකහවණුවක් ගැන පොත පත හෝ සෙල්ලිපි හෝ සාක්ෂ්‍ය නො කියයි. 'කා' අක්ෂරය 'කී' යි ගත හැකි වෙතොත් 'ලාංකික' යයි ගෙන අවුල බොහෝ දුරට මකා ගත හැකි බව් පෙනේ. මේ වනතුරු ම දකින්නට ලැබී තිබෙන්නේ මේ වර්ගයේ එකම කාසියක් පමණෙකි. එය විශෙෂඥයන්ගේ නො ඉව සිල්ලට කරුණෙකි. දෙ අක හෙවත් පලය ග්‍රෙන්ස් 17 ක් කිරෙයි. යටපැත්තේ ලක්ෂ්මී යන අකුරු වෙයි. කහවණුවෙන් අටෙන් කොටස වූ අක ග්‍රෙන්ස් 8½ ක් කිරෙයි. යටපැත්තේ නො පැහැදිලි අකුරු විශෙෂඥයන්ගේ මොලය අවුල් කරවයි. එය රීස් ඩේවිඩ්ස් මහතා කාම්රනී යි කියවා අර්ථයක් නො දැක උපෙක්ෂිත විය. කොඩ්රිංටන් මහතා උරක, දරක, ඉරක යි කියවා අර්ථයක් නො ලැබ කෘෂ්ණ ගේ විරුද නාමයක් වන නන්දකී සේ ගෙන තෘප්ත විය. සිංහලයෙහි අක යනු සවල්පාර්ථයෙහි ද වැටෙන බැවින් ඉතා කුඩා කාසිය වූ මෙයට අක යන නම ලැබිණැයි අපට සිතේ. එකල සුලභ වූ කාසිය ද මෙය යෑ.

## සොළී කාසි

මෙමැ කාසි ප්‍රචාරයෙහි වැටී තිබෙන සමයෙකැ එනම් ක්‍රි. ව. 985-1012 අතර සමයෙකැ ලකැ පැමිණ සිය අණසක පතුරුවා ජනපාලනයට පටන් ගත් රාජරාජ රජු කහවණුව අනුගමනය කර නිපැදූ වූ කාසියක් නිකුත් කළහ. ඔහු එහි කළ එකම වෙනස නම් 'ශ්‍රී ලඞකා විභූ' යන්න වෙනුවට 'ශ්‍රී රජරාජ' යි තම නම යෙදීමයෑ. එ වැනි ම දළ සටහන් ඇති තවද කාසියක් දකුණු ඉන්දියාවේ භාවිතය සඳහා නිකුත් කළ හෙයින් ඔහු කහවණුව අනුගමනයෙන් රන් කාසි දෙවර්ගයක් නිකුත් කළහ යි සිතන්නට මං තිබේ. අගනුවරත් ලකැ උතුරු පෙදෙසත් සොළී බලයට යටත්වැ තුබුණු ශත වර්ෂයක් පමණ කාලය තුළ කාසි නිකුත් වූ බවක් නො පෙනේ.

## දඹදෙණි කාසි

එතැන් සිට ලංකාවේ රජ පැමිණි රජවරුන් අතුරෙන් පළමුවන විජයබාහු (105 .-1111) පළමුවන පරාක්‍රමබාහු (1153-1186) නිශ්ශඞ්කමල්ල (1187-1196) චොඩගඟ (1196 1197) ලීලාවතී

නිසොව (1197 1200; 1209; 1211) සාහසමල්ල (1200–1202) ධර්මාශොක (1208–1209) ද්විතීය පරාක්‍රමබාහු (1236–1271) සිවුවන විජයබාහු (1271–1273) සහ පළමුවන භුවනෛකබාහු (1273–1284) යන රජවරුන්ගේ සමයවලැ ද කාසි නිකුත් විය. සොළී රජු ගිය මග යෙමින් තමන් තමන්ගේ නම් යොදා තිබීම ඔවුන් කළ කාසිවලැ පැනෙන විශෙෂ ලක්‍ෂණයෙකි.

සිංහල රජවරුන්ගෙන් පළමුවෙන්ම නමක් යොදා කාසි නිකුත්කිරීමේ ගෞරවය හිමි වන්නේ පළමුවන විජයබාහු රජුටය. එතුමාගේ කාලයෙහි විශෙෂයෙන් සැලැකිය යුත්තේ තවද කාසියක් උදාවීමය. එය තඹ කාසියකි. එකල රන් දුලබ වීමය එය තඹෙන් නිමවන්නට හේතුව වූයේ. එසේම වෙනත් ලෝහයන් ගෙන්ද කාසි නිකුත් වන්නට පටන්ගති. එය අප රටෙහි පමණක් වූ අමුත්තක් නොවේ. සොළී රටෙහි ද වූ අමුත්තකි. 13වන ශතවර්‍ෂය මුල් භාගයේ දී ද නිකුත් කැරුණේ තඹකාසි පමණකි. 12-13 වන ශතවර්‍ෂවලට අයත් තඹ කාසි දඹදෙණිකාසි නමින් හැඳින්වෙයි. ඒවා අවසාන වරට අච්චුගැසීම වූයේ දඹදෙණියෙහි බැවිනි. මෙමැ සියලු කාසිවලම රාජනාමයට පෙරටුව ශ්‍රී යනු යෙදී තිබීම සඳහන් කළ යුත්තකි. දඹදෙණි කාසියෙහි නිර්මාණය රළු යැ. ප්‍රතිසංස්කෘත යැ. සරල රේඛා තුනකින් රූපයේ මුහුණ සම්පූර්ණ කෙරෙයි. පහත හෙළා දක්වෙන අතෙහි එල්ලන පහනක් ද උඩට හැරූ වූ අතෙහි නෙළුම් කැකුළක් ද වෙයි. යටපැත්තෙහි රූපයේ උඩට හැරූවූ අතින් සකක් ගෙන සිටිනු දක්වේ. පළමුවන විජයබාහු–පළමුවන භුවනෛකබාහු කාලයෙහි කාසි එක්වැනි වුවද කාසි අච්චුගැසුවන්ගේ පටු දැනීම නිසා ඒවායෙහි සටහන් හැඩහුරු කම් ආදියෙහි අඩුලුහුඬු කම් ගහණය. රාජනාමයන් යොදා තිබෙන නිසා අසුවල් රජුගේ කාසි යයි තෝරාගැනීම අසීරු නොවේ. එහෙත් එක නම ඇති රජවරු කීපදෙනකුන් වූ බැවින් ද කෙනෙක් අනිකකුගෙන් වෙන්කර ගැනීමට වහල් වන අංකයක් යොදා නැති බැවින් ද, පෙර පසු වශයෙන් වෙන් කොට දක්වීම ඉතා පරිස්සමින් කළ යුතු වේ. කහවණුයෙහි මෙන් මෙමැ කාසියෙහි ද භාග කාසි ඇති විය. එහෙත් සුලභ වශයෙන් නො වේ.

නිශ්ශඞ්කමල්ලකාසි ශ්‍රී. කා. ලි. ග. ල. කෝ. ජ. යන අඩයාළමින් හැඳින් වේ. ශ්‍රී කාලිංගලඞ්කෙශ්‍වර විය යුතු. එය මෙසේ වූයේ කාසි අච්චුගසන්නන්ගේ නො සමත්කම හා අල්ප දැනීමෙ හේතුයෙනි මේ රජු අන් රජුන් ගිය මග නොයාම හෙවත් සිය නම කාසිවල නො යෙදීම විමුක්තියට කාරණක් ද? නැති, තමන් කැරූවූ සියලු

සෙල්ලිපිවල සිය නම නිශ්ශඞ්ක ලඞ්කේශ්වර කාලිඞ්ග චක්‍රවර්ති යි යොදා තිබෙන සේ පෙනෙන හෙයිනි. දෙරටියා තුඩපතෙහි ශ්‍රී කාලිඞ්ග ලම්කෙසුරු කියා ද හැටදාගේ සන්නසෙහි කාලිඟු ලකිඳු කියා ද මොහු සඳහන් කළහ.

ලඞ්කේශ්වර රන්කාසිය හෙවත් කහවණුවත් පරාක්‍රම රාජ නාමය සඳහන් තඹ කාසියත් සමකාල යෙහි වියැ යි ද, රූපය පළමුවන රාජරාජ කාසිය ගුරු කොට තබා කැරුණක් වියැ යි ද කලක සිට කරගත් තීරණයෙකි. කොඩ්රිංටන් මහතාගේ නිපුණ පරීක්ෂණයෙකින් පසුවැ ඒ තීරණය වෙනස් විය. ඊට ඒ මහතා ඇරැ දක්වන කරුණුය මේ:



දඹදෙණි කාසිය.
(නිශ්ශඞ්කමල්ල)
(12-13 ශත වර්ෂ.)

i ලඞ්කේශ්වර රන් කාසියෙහි අකුරු පරාක්‍රම කාසියෙහි අකුරුවලට වඩා වෙනස්ය. පැරැණිය.

ii නව වන ශතවර්ෂය මුල්භාගයට අයත් ජේතවන සෙල් ලිපි අකුරු හා එහි අකුරු හා සමානකම් පවතින හෙයින් සෙල්ලිපි විද්‍යාව අනුව එය නව වන ශතවර්ෂය අවසාන භාගය නොහොත් දසවන ශතවර්ෂය මුල හවුරුදු කීපය අතරැ පහළ විය යුතුය.


iii මතුයෙහි නානා දක්වෙන මිනිස් සටහන කහවණු යෙහි පටන් පිකින්ටිත පිරිහී ආ ලෙසක් පෑනේ. රාජරාජ කාසියට සමකාලීනව සමාන සටහන් දක්වෙන්නේ අවසාන භාගයේ ලඞ්කේශ්වර කාසියේ පමණකි.

iv දහ වන ශතවර්ෂයට අයත් සොළී සෙල්ලිපි කීප යක ද ඉලක්කාසු යි ලාඞ්කාය කාසි (කහවණු) ගැන සඳහන් වෙයි.

මෙම කරුණු පරිස්සමින් බලන කල ලඞ්කේශ්වර රන්කාසිය රාජරාජ කාසියට වඩා පැරැණි බව් හා සිංහල කහවණුයෙහි තැංවුණු රූ සටහන රාජරාජ රජු ආදර්ශයට ගත් බව හා හෙළි වෙයි.

# යාපනයේ කාසි

යාපා පටනෙහි භාවිතය සඳහා දඹදෙණි කාසිය ආශ්‍රයයෙන් ආයර්‍ය චක්‍රවර්තීහු කාසි දෙවර්‍ගයක් නිකුත් කළහ. ඉන් පළමු වැන්නෙහි දඹදෙණිකාසියේ වැනි රූ සටහන් ඇතත් යටපැත්තේ හිඳුනා මිනිස් රුවට යටින් නාගර අකුරු වෙනුවට පහත සිට උඩට කියවිය යුතු සේතු යන දෙමළ අකුරු දෙකක් වෙයි. දෙවන කාසියෙහි යටපැත්තේ සිටුනා මිනිස්රුවට හා නාගර අකුරු වෙනුවට පෙර ලක කිසිද කාසියක නො දිස්නා ගව රුවක් පෙනේ. වමේ සිට කිය විය යුතු සේ 'සේතු' යන වචනය එයට පහතැ සටහන් වෙයි. ගවරූපය කාලිඟු රජුන්ගේ ජාතික සලකුණ යයි කොඩ්රිංටන් මහතා කියයි.



සේතු කාසිය.
(14-16 වන ශතවර්‍ෂ.)

පොළොන්නරු - දඹදෙණි කාසි කළ කල ඒ පෙදෙස්හි සුලභව ලැබෙන්නේ 'සේතු' කාසිය හා සිංහ කාසිය හා යන තඹ කාසි දෙකය. කාලිඟු රටින් පැමිණි ලඞකාධිපත්‍යයට පැමිණි මාඝාදීන්ගේ බලය මෙහි කො තරම් බල පැවැත් විණි දැයි මෙයින් සිතා ගත හැක.

දඹදෙණි කාසියෙහි උඩපැත්තේ සිටුනා මිනිස් රුව පසෙකින් දැක්වෙන ගොළාකාර සටහන් වෙනුවට මූව අයා නෙත් දල්වා තේජස් ලීලායෙකින් උකකුටුකයෙන් හිඳුනා සිංහ රූපයක් දැක්වෙන කාසිය සිංහකාසිය යැ. ශ්‍රී පරාක්‍රමබාහු යන අකුරුය එහි ද වනුයේ. දඹදෙණි කාසියෙහි නො මැති සිංහරූපයක් ඊට වැදූ ගැනීමට හේතුව එය පරාක්‍රමබාහුන්ගේ අණසක පවතින අන් රටෙක භාවිතයට කැරුණක් නිසා විය යුතුය. අපේ ජාතික සලකුණය සිංහරූපය. මේ මතය උඩ පිහිටා බලන මේ විශෙෂ කාසිය නිකුත් කිරීමේ ගෞරවය i වන පරාක්‍රමබාහු vi වන පරාක්‍රමබාහු යන මොවුන්ගෙන් කෙනකුට හිමි වෙයි. අන් පැරැකුම්බා කෙනකුන් පර දෙශයක තම බලය නො පැවැත්තූ හෙයිනි. i වන පරාක්‍රමබාහු පඬිරට ගොස් යුද කොට එහි හම නමින් නුවරක් ද ඉදි කොට තමාගේ කාසි ද භාවිත කරන්නට සැලැස්වූහ යි මහාවංසය 77 වන පරිච්ඡෙ

දය කියයි. vi වන පැරකුම්බාවෝ ද තම රජෝදයෙන් සතිස් වනු යෙහි සපුමල් කුමාරයන් ප්‍රධාන සේනාවක් යවා ආර්‍ය චක්‍රවර්තීන් යටතෙහි පැවැති යාපාපටන සුළු කලකට වුව ද යටත් කරගත්හ. මෙහි ලා i වන පැරකුම්බා රජු පඬිරට භාවිතයට සැලැස්වූහ යි මහාවංසය කියන කාසිය මෙම සිංහ කාසියම නොවේ යයි නො කිය හැකි දැයි පිරික්සා බලමු. පරාක්‍රම කාසි එරට භාවිත කරන්නට නියම කැරුණු බවක් මිස ඒ සඳහා යම්කිසි කාසියක් මුද්‍රණය කළ බවක් මහාවංසය නොද කියයි. පොළොන්නරු සමයට අයත් නටබුන් අතර එකද සිංහ කාසියක් නො වී. සිංහ කාසියේ මිනිස් රුව හා 'සේතු' කාසියේ මිනිස් රුව හා මුහුණුවරින් ළඟ නෑකම් දක්වයි. එහෙයින් සිංහ කාසිය කෝට්ටේ පැරකුම්බාවන් යාපා පටනෙහි භාවිතයට නිකුත් කළහ යි තීරණය කළ යුතු වේ. දැනට සොයා ගෙන තිබෙන සිංහකාසි වලින් සතරෙන් තුන් කොටසක් පමණ කෝට්ටේ නටබුන් අතුරින් ලැබී තිබීමත් එම සටහන එබ්බූ පුවරුකඩ රාශියක් කෝට්ටේ අලකෙශ්වර පොකුණ අසලින් මේ නොබෝදා අනාවරණය කරගන්නට ලැබීමත් මෙම මතය තවද තර කෙරෙයි.

## මසුරන්

---

අද ද මසුරන් ගැන කථා කියන්නෝ බොහෝ යැ. පුරාණයෙහි මිළ ගණනක් වී නම් එය මසුරන් ගණනින්ම ගෙනය ඔවුන්ගේ කථාව. එහෙයින් මේ හුඟක් දුර එළඹා විමසන්නට වුවමනා වූවකි. රුවන්මැලි සෙල්ලිපියෙහි "සතලිස් ලක්‍ෂයක් මසුරනින් පූජා කොට....... රන් රිදී මසුරන් මුතු මැණික් වස්ත්‍රාභරණාදි වූ උත් උත් කැමැති වස්තු හා"යි නිශ්ශඞ්කමල්ල රජු සඳහන් කැරවූහ. දළදා මැඳුරේ සෙල්ලිපියෙක 'රන් රිදී කහවණු මුතු මැණික් වස්ත්‍රාභරණාදි' යි ද, ගල්පොත සෙල්ලිපියෙහි 'කහවණු තඹලොහො රන් රිදී මුතු මැණික් වස්ත්‍රාභරණාදි අනෙක ධන වර්‍ෂාවෙන් දිළිඳුන් ගිම් නිවා"යි ද ඔහුම සඳහන් කැරවූහ. 12 වන ශත වර්‍ෂයේ සැරියුත් තෙරණුවන් කළ පාළිමුක්තක විනය විනිශ්චය ටීකායෙහි රූපයාදි පටිග්ගහණ විනිශ්චයෙහි 'ජාත රූප මාසකොති සුවණ්ණ කහාපණො රුක්ඛ ඵල බීජමයොති නිතනිඹිසාදි රුක්ඛා නං.......'යි එන පාඨය බුද්ධඝොෂ කාලෑ වූ රන් මාෂකය එකලෑ රන් කහාපණ නමින් වැහැරවුණු බවට දෙස් කියයි. 'පරමිතිස්

11919 ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

සතක්හු අයත්........(තමා කෙරෙන් අන්‍ය වූ මිනිසකු සන්තක)පල් පොහොනා වතක් (පරාජිත පොහොනා වස්තුවක් හෙවත් මසුරන් දෙකක් අගනා යම්කිසි වස්තුවක්, මෙහි මසුරන් දෙකක් නම් දූත් පවත්නා කහවණුවක් දෙකක් දෙකක් බැගින් සතර කොටසක් කළ කල්හි එයින් එක් කොටසකි'යි **සිඛවලඳ විනිස** පාඨය අඩින් අඩ කහවණුව මසුරන නමින් හැඳින්වුණු බවට දෙස් කියයි. මේ කරුණු සමනා බලන කවර කාසියක් වුව ද පෙරළ මසුරන නමින් ම ගැනීමට බාධාවක් නො තිබුණැයි හැඟී යේ

17 වන ශතවර්ෂයේ **කාංගම්** නම් පෘතුගාල් කාසිය **කාංගම්මසස** නමින් ද භාවිත විණ. 18–19 වන ශතවර්ෂවල **සොකු කාසිය** ද **මසස** නමින් භාවිත වන්නට විය. **මසස** යනු ද කාසි කිප වර්ගයකට සාමාන්‍ය නාමයක් සේ ව්‍යවහාර කැරුණු බව මෙයින් කියැවෙයි. උම්මග්ගජාතකයෙහි "ඔහු යහපතැයි බිසොවුන් දුන් මසු ලක්‍ෂය ඇරගෙන ගෙය බිසොවුන්ටම අළුහ. වැළිත් ඒ මසුරන් ලක්‍ෂය නම් දූත් මේ සමයෙහි දු තඹ ආදී පස්ලොයින් ගැසූ රනෙක් නො වන්නේය. ඒ රනට නීලකහාපණ යයි කියති. ඉන් සතර අකෙක් මාෂ රත්රන. සතර අකෙක් පස්ලෝය. එබැවින් ඒ බිසොවුන් දුන් මසුරන් ලක්‍ෂයෙන් පනස්දසෙක් මාෂ රත්රනැ යි දතයුතු" යනුවෙන් රන් සම්බන්ධයක් මසුරනෙහි පැවැති ලෙසක් පෙනුන ද රනින් කැරුණු හෝ නො කැරුණු හෝ මිල වෙසෙසකට මසුරනැ යි ව්‍යවහාර වූ බව් එකලා වැ කියැවෙයි මෙම මිල වෙසෙස කහවණුව කින් විස්සෙන් කොටසක් ඇගි බව් **පූජාවලිය** මෙසේ කියයි. "මෙසේ සොළොස්දහසක් නීල කහාපණ සංඛ්‍යාත වූ රන් දී ........බැවහාර රනින් විස්සෙක් නම් නීල කහාපණයෙන් එකෙක් වෙයි. තුන්ලක්‍ෂ විසිදහසක් මසුරන් දෙන්නාහු......" මහාවංසයෙහි 81 වන පරිච්ඡේද යෙහි තුන්වන විජයබාහු රජු සුවාසූ දහසක් ධම්මක්ඛන්ධයන් ලියවා ලිපිකරුවනට සකන්ධ ගණනින් කහවණු දුන්හ යි පළවෙන පාඨය විමසමින්ම කහවණුව ගැන **කොඩිරිංටන් මහතා** මෙසේ විවරණ යක් කෙරෙයි: "එම දහම් කොටස් කෙටි යැ ඇතැම් කොටසක් පේළි කීපයකට පමණක් සීමා වෙයි. එක් කොටසකට රන්කහවණු වක් දීම ද ඉතාම වැඩිය. එහෙයින් 'කහවණු' යි මෙහි සඳහන් වනුයේ එකල මසුරන නමින් ද හැඳිනැවුණු කහවණුයේ අටවන භාගය වූ අක විය යුතුය" "එක් කහාපණයක් නම් දූත් පවතින ලංකාවේ පණමින් පස් විස්සක් හෝ තිසක් හෝ අගනේය"යි අවවාද පරිච්ඡේදය කියයි. දළදාසිරිතෙහි "දළදාගෙන් කහවණුවක් විතරකුත් රජගෙට නො ගන්නා ඉසා"යි එන පාඨයෙන් කහවණුව එකල ඉතාම ලුහු මිලයක්ව පැවැති බව් හෙළි වෙයි.

අත 14 වන ශතවර්ෂයෙහි **පණම** යන ද්‍රවිඩ නමින්ද හැඳිනු වුණු සෙයෙක් පැනෙන බව කොඩ්රිංටන් මහතුන්ගේ තවද විතර්කයෙකි. මෙම පෙරළිය ඉන් නො නැවැතිණ. දඹදෙණි කාසිය ද මසුරන යන නමින් හැඳින් වෙන්නට පටන් ගනී.

## පණම් කාසි

සිව්වන පැරකුම්බා සමයට අයත් ලංකාතිලක විහාරසත් සන්නසෙහි "..............ආචාර්යවරුන්ට දුන් වීන්, රන්රන්, රිදී, පිළී ඇතුළු වූ දෙසින් මසුරන් අගයෙන් තුන්සෙල සැට ලක්‍ෂයක් දී අවුරුද්දකට **ගෙයකින් පණමක්** නියායෙන් දෙන්ට සැලසුනු පිංදීනී පණමක් අතුළුව" සිද, ගඩලාදෙණි විහාරසත් සන්නසෙහි "කර්මාන්තකාරයන්ට පණම් තුන්දහසක් විතර දී" සි ද පැනේ. පැපිළියාණ සන්නසෙහි රන්මසුස, මසුස, පණම යන තුන්කාසියම සටහන්වැ තිබේ. මයාදුනු රජුකල කෝට්ටේ අවට මුහුදු තරින් එක් කළ අංබිදු පණම් 12350 ක් යයි **පෝල් ඊ. පීරිස් මහතා** ප්‍රතිකාල් යුගය නම් තම පොතෙහි සඳහන් කරයි. "තුන් වන වර්ගය රාජකීය කාසිය යැ. එය මරණය නො කැමැති කිසිවකුට අව්වුගැසිය නො හැක. පණම යයි කියනු ලබන එය දිලෙන බොත්තමක් මෙන් කුඩාය. අගයෙන් පණම් කාසි 75 කට හෙවත් අවේ කාසිය (පතාගය=ශත 75 කාසිය) කට සමානය. නැත් නම් ස්පාඤ්ඤ ඩොලර් එකකට සමානය සි" රොබට් නොක්ස් (1659-1679) පණම ගැන කීය.



පණම් කාසිය.
(15-17 වන ශතවර්ෂ)

## ප්‍රතිකාල් යුගය


ශ්‍රී ජයවර්ධන පුරය හෙවත් කෝට්ටේ රජය කළ අට වන වීර පරාක්‍රමබාහුන්ගේ රාජ්‍යොදයයෙන් 21 වැන්නෙහි ප්‍රතිකාලුන්ගේ පළමුවන ලංකාවතරණය සිදුවිය. ඉන්පසු කිපවරක් ද සිදු වූ පැමිණීමෙන් මුහුදුබඩ පළාත් අයිති කරගත් ඔවුහු මල්වානේ ගිවිසුම ලියාගත් පසු ලංකාව ආණ්ඩු කිරීමට පටන් ගත්හ. ලංකාවෙන් ලබාගත හැකි සාරයෙහි ඉව වැටුණු ඕලන්දයන් විසින් 1658 වනවිට සම්පූර්ණයෙන් පිටමන් කරනු ලැබූ ඔවුන් පැමිණෙන කල ලංකාව මුදලින් පොහොසත්ව නො තිබිණ. කෝට්ටේ රජු

විසින් බාල රනින් හෝ රිදීයෙන් උඩු පියලි කොළයක් පමණට කරවා නිකුත් කැරුණු වටකුරු පණම් කාසියක් එකල ප්‍රධාන කාසිය විය. එහෙත් ගනු දෙනුයෙහි වැඩි වශයෙන් යෙදවුණේ පාරදෙශික කාසි යැ. භාරතයේ විජය නගර් රජවරුන්ගේ රන් පගෝඩ්ය, අරාබින්ගේ අෂ්රාෆි හෙවත් ෂැරෆිම් රන්කාසිය, රිදී කොකු කාසිය ඉන් කීපයෙකි.

අරාබි කාසි ලංකාවේ භාවිත වන්නට මූලික හේතුව වූ යේ ඔවුන් සමඟ මෙහි පැවැති වෙළෙඳාම ය. අරාබින් ලංකාවතරණය කළ කාලය නියම වශයෙන් කිය නො හැකි වුව ද 10-15 වන ශත වර්‍ෂ අතර ඔවුන් ඓන්දීය සාගරාසන්නයෙහි ප්‍රධාන වෙළෙන්දන්වැ සිටි බවට සැකයක් නොමැති සි. ක්‍රි. ව. 930 දරණ අරාබි සෙල්ලිපි යක් කොළඹ මහම්මත් සොහොන් බිමැ තිබිණැ යි එංගලන්තයේ රාජකීය ආසියාතික සමිතිය 1845 වර්‍ෂයට නිකුත් කළ සඟරාකලාප යෙහි සඳහන් වැ තිබේ. අරාබීන්ගේ ප්‍රධාන වෙළෙඳාම වූයේ අසුන් වෙළෙඳාම ය. නිශ්ශඞ්කමල්ල සෙල්ලිපියක ද අරාබි අසුන් ගැන සඳහන්වන බවක් කොඩ්රිංටන් මහතා කියයි. අරාබි කාසි බොහෝ සෙයින් ලඞ්කාවේ බටහිර වෙරළාසන්නයෙන්ම ලැබීම ඔවුන්ගේ වාණිජ සීමාව නියම කරගන්නට ඉවහල් වෙයි.

## අඟුටු මස්ස

ඉංග්‍රිසියෙන් **ලැරින්** (Larin)යයි කියන අරාබි කාසියක් ද ලංකාවෙහි භාවිත විය. අඟල් 4 ක් පමණ දිග රිදී කම්බි කැබැල්ලක් හරි මැදින් දෙකට නමා මදක් තළා පැතැලි කොටගත් දෙපැත්තෙහි ‘දෙවියන් වහන්සේගේ දූතයා මොහම්මදුය’; ‘අලි දෙවියන් වහන්සේගේ මිත්‍රයෙක’ යන මේ අදහස් වලින් එකක් අරාබි අකුරින් නගා දක් වෙන්නෙහි එය. බොහෝ සෙයින් පතළ වීම නිසා මහනුවර රජුනට ද ඒ කාසිය අනුගමනයෙන් නිපැදවූ කාසි නිකුත් කරන්නට සිත් ලැබිණ. එ මතුද? කැමැති කෙනකුට එය




අඟුටු මස්ස
(15-18 වන ශත වර්‍ෂ.)

අච්චු ගසා ගන්නට රජයෙන් තහනමක් ද නො වීය යෙති. ඒ කාසිය ගැන විස්තරයක් **රොබට් නොක්ස්** මෙසේ දක්වීය: "රජුගේ අවසරය ඇතුව හැම මිනිහාටම සාදා ගත හැකි තවත් වර්ගයකි. සටහන බිලිසාටුවක් වැනිය. එහි ඔවුහු කැමැති ලකුණක් තබති. රිදී කාසිය අඩේ කාසියට වඩා පැහැ සටහනින් කඳීමය. සැක සහිත කාසියක් නම් නිරණය කර ගැනීම අසීරු නොවේ. ගින්නෙහි ලා රත් කොට වතුර වත්කිරීමෙන් මනාව සුදුනූනොත් වලංගු කාසියක් නොවන බව ප්‍රකාශ වන හෙයිනි". කොකුරිදීය, මහඅඟුටුය, අඟුටුය, අඟුටු මස්සය, කොකුමස්සය යි ලැරින් කාසිය තවද නම් වලින් හැඳින් විණ. වීරපරාක්‍රමබාහු රජු හා ලොපෙස්සෝරස් ද අල්බර්ගේරියා හා අතර ඇති වූ කථාවකදී පරාක්‍රමබාහු රජු 'මිනීමැරීමේ වන්දියකට ලැරින්ස් 50 ක් ගෙවිය නො හැකි වූ වකු මරණයට පත් කොළෙම්' කීහ යි පෝල් ඊ. පීරිස් මහතාගේ පෘතුගීසි යුගය නම් පොතෙහි සඳහන් වෙයි. එතැනය ලැරින් කාසිය ලංකා ඉතිහාසයෙහි පළමුවරට සඳහන්වැ ද තිබෙනුයේ. තම විජිතයෙහි මුදල් පරිහානිය නිසා දොන් ජුවන් ධර්මපාල රජු රිදී කඩුවක් හා කිරිච්චියක් හා ඉන්හෙම්ස් නැවේ කප්පිත්තනට දී ඉන් 'ලැරින්' අච්චුගසන්නට නියොගයක් කළහ යි ද කූටෝගේ ඉතිහාසය කියයි.

16 වන ශතවර්ෂය අවසාන භාගය හා 17 වන ශතවර්ෂය මූල භාගය හා අතර කාලයෙහි යාපනය, උඩරට යන පළාත්හි සපාසැඳ කාසියක් ගනු දෙනුයෙහි යෙදුවිණ. පසුකලෙක එය පතාග නමින් හැඳිනෙන්නට පටන් ගති. සීතාවක කැරැල්ලේදී රාජෝද්‍යානයෙහි කීප පළක වළලා තුබුණු පතාග කාසිවගයක් සම්භ වූ බවක් ද සඳහන් වේ. කොකු මසු හෙවත් රිදී කාසි 5 ක් පතාගයක වටිනාකමට සම වියැ.

දොන් ජුවන් ධර්මපාල රජුගෙන් පසු කෝට්ටේ අධිපති බවට පත් ප්‍රතිකාලුන් අච්චුගැස්සූ කාසි තුන්වගයෙකි. ගිනිමැස්ස, මලක්කා, සාතානුවර යයි. ගිනිමැස්ස වර්ගයෙහි උඩපැත්තේ වොටුන්න සහිත ප්‍රතිකාල් රාජ චිහ්ණය දෙපසැ කොළඹ යන අදහස පළ කැරෙන C. L. යන දෙ අකුර සඳහන් වෙයි. යට පැත්තෙහි සනාතලොරන්ස්ගේ ගිනිමැස්ස සටහනද, එහි දෙ පසැ කාසිය නිකුත් කැරුණු වර්ෂය ද දක්වෙ යි. බර ග්‍රෙන්ස් 35 පමණය. 1640, 1641, 1645 යන වර්ෂවල ඒවා නිකුත් කළහ. දෙවන වර්ගයට තංගම ය විතංගම යයි කාසි දෙකක් අයිති වේ. එහිද වනුයේ උඩ පැත්තෙහි ප්‍රතිකාල් රාජ චිහ්ණය යැ. ඒ දෙපසැ MALACCA යන්න සඳහා යෙදූ

M. A යන දෙ අකුර හෝ ලංකාව සඳහා යෙදූ D. S. අකුරු හෝ යැ. දොන් ජෙරනිමෝ ද අස වේදෝ හා කොන්ස්තන්තිනු ද සා හා දෙදෙන ප්‍රතිකාලුන් වෙනුවෙන් මෙරට භාවිතයට කාසි අච්චුගැස්සූහු. ප්‍රතිකාල් සමයයේ රිදී පණම් 75 ක් අටේ කාසිය කට හෙවත් ස්පාඤ්ඤ ඩොල රයකට සම විය. තංගමෙහි TANGA යනු සඳහා යෙදූ එකක් මත අනෙක සිටින සේ ගොනා දක්වෙන T A බද්ධාක්ෂරය



ප්‍රතිකාල් කාසිය
තංගම
(16-17 ශත වර්ෂ)


(Monogram) ද එහි දෙපසැ එය නිකුත් කැරුණු අවුරුද්ද ද සටහන් වැ තිබේ. 1642, 1643 යන වර්ෂවල නිකුත් කැරුණු ශ්‍රෙන්ස් 34 ක් බරැති තංගම ද 1642, 43, 44, 49 යන වර්ෂවල නිකුත් කැරුණු ද්විතංගම ද එකල භාවිත විණ. තුන්වන්නෙහි සාන්තුවර වර්ගයෙහි උඩ පැත්තේ රජ සටහන දෙපසෙහි GOA සඳහා යෙදුණු GA යන දෙ අකුර වෙයි. යටපැත්තේ සාන්තුවර රූපයකි. එහි දෙපසැ St. John යන අදහස පළකැරෙන S. J අකුරු යැ. මේ සියලු කාසිවල ප්‍රතිකාලුන් සියරාජ සලකුණ යෙදීම සැලැකිය යුත්තකි. නිකුත්කළ වර්ෂයන් යොදා කාසි අච්චුගැස්සීමේ ගෞරවයද හිමිවන්නේ ඔවුනට යැ.

## ඕලන්ද යුගය

---

ප්‍රතිකාලුන් මෙ රටින් පන්නා දමන්නට 1638 මැයි මස 23 වන දින සිංහල රජු සමඟ ගිවිසුමක් කරගත් ඕලන්දයෝ 1640 දී ගාල්ලෙන්ද 1656 දී කොළඹින්ද ප්‍රතිකාලුන් පලවා හැර ඔවුන් සතුවැ තුබුණු පළාත්ද අයිති කර ගත්හ. 1796 වනතුරු මුහුදුබඩ පළාත් ඔවුන්ගේ ආංඩුව යටතෙහි පාලනය විය. ඔවුන්ගේ ආණ්ඩුවේ මුල් කාලයෙහි රටෙහි භාවිත වූයේ ප්‍රතිකාල් කාසිමය. හොරකාසි අච්චුගසන්නන් නිසා කූට කාසි තදින් බෝවන්නටද එකල පටන් ගැනිණ. එ හෙයින් රටෙහි පැතිරී ගොස් තුබුණු සියලු කාසි 1655 දී ආංඩුවට එකතු කර ගෙන පෙරදිග ඉන්දියානු ඕලන්ද සමාගම යන අර්ථවත් ඉංග්‍රීසි පාඨයේ V O C බද්ධාක්ෂරය කිරීමෙන් රජයේ

කාසි වෙන් කොට දක්වන්නට ඔවුනට සිදුවිය. එහෙත් එයින් කිසි ද පිහිටක් නො ලැබිණි. කූට කාසියද එම හන්වඩුව ඇතිවැ බෝවන්නට වියැ. එහෙයින් ඉන්දියාවෙන් කාසි අච්චුගසන්නන් ගෙන්වා විමසවා 1693 දී රජයේ කාසි වෙන් කරවා ගන්නට නවද වැයමක් කරන්නට සිදුවිය ඕලන්දයේ භාවිත වුණු රිදී කාසි කීපවර්ගයක් ද මෙරට භාවිතයෙහි යෙදුවිණ. ඒවා ඕලන්දය, ගැල්ඩර්ලන්දය, බටහිර ෆ්‍රිරිස්ලන්දය, සීලන්දය, ඩැවැන්ටර්, කැම්පන්, යූට්රැජ්ට් යන රටවල අච්චුගසනු ලැබීය. උඩපැත්තෙහි V O C බද්ධාක්ෂරය හා යටපැත්තෙහි ඕලන්ද රජයේ සලකුණ හා ඇතිවැ 1726–1806 අතර මුද්‍රණය වුණු දොයිතු නම් තඹ කාසිය ද මෙ රටෙහි බොහෝ සේ පතළ විය. රිදී හා තඹ හා ඊයම් හා කාසි කීපයක් මෙරටෙහි ද සැදිණ. ඉන්දියාවේ සුරත් නගරයෙහි භාවිත වුණු රුපියලේ කාසිය අනුගමනයෙන් උඩපැත්තෙහි කොළඹ-ඕලන්ද සමාගමේ කාසිය සිද යටපැත්තේ ලංකාවේ මුදල් සිද අරාබි අකුරින් යොදා කළ රිදී කාසියක් 1784 දී නිකුත් විය. කවාකාරව යෙදූ ලියවැල් සටහනක් මධ්‍යයෙහි වටිනාකම දක්වෙන කොළඹ හෝ යාපනයේ හෝ මුද්‍රිත කාසිය ය, උඩපැත්තේ V O C සටහන හා යටපැත්තෙහි තුට්ටුව යි දක්වෙන ඉංග්‍රිසි වචනය හා මුද්‍රිත වර්ෂය හා දක්වෙන කාසිය යයි ඕලන්දයන් මෙහි පතළ කළ තුට්ටු කාසියේ භෙද දෙකෙකි. පෙරැකී වර්ගයට තුට්ටු දෙක, තුට්ටුව, තුට්ටු බාගය, තුට්ටු කාල, තුට්ටු අරික්කාල යන කාසි කීපය ඇතුළත් වෙයි. මේ හැම එකක ම V O C සටහන නො වෙනස් වැ යෙදී තිබීම විශෙෂ ලක්ෂණයෙකි. එකල ත්‍රිකුණාමලය T යන්නෙන් ද යාපනය I යන්නෙන් ද ගාල්ල G යන්නෙන් ද කොළඹ C යන්නෙන් ද හැඳින්වියැ. දෙ වර්ගයෙහිම V O C සටහන මුදුනෙහි අච්චුගැසුණු ස්ථාන නාමය දක්වා තිබේ. 1785, 1789, 1790, 1791, 1792 යන වර්ෂවල කොළඹ අච්චුගැසුණු ඊයම් කාසියක්ද සුළු වශයෙන් පැතිරී ගියේය. දොයිතු (Duits) යන ඉංග්‍රිසි වචනය හෝ එහි මුල අග වන D. T. යන දෙ අකුර හෝ ඇති වටකුරු කාසියකි ඒ.



ඕලන්ද කාසිය
තුට්ටුවේ තඹ කාසිය

## මුදල් නෝට්ටු

මුදල් නෝට්ටු ක්‍රමය මෙරටැ පටන් ගැනුණේ ඕලන්දයන් විසිනි. පළමුවන නෝට්ටුව 1785 මැයි 10 වන දින පහළ විය. වටිනාකම සඳහන් වූයේ පතාග ගණනිනි. පතාග 1 සිට 1000 දක්වා වටිනාකම් වලට නිකුත් කැරුණු මේ නෝට්ටු ක්‍රමය නිසා ලොකු ගනුදෙනු කාරයනට ලැබුණු වහල ඉතා මහත් වේ. කුඩා ලොහ කාසි රශියක් ගණන් කිරීමේ කරදරය නැතිවී ගියේය. කාලයෙන් බොහෝ කොටසක් ද ඉතිරි වියැ. ඉංගිරිසි, සිංහල, දෙමළ යන තුන් භාෂායෙන්ම **පතාග එකකට හොඳයි** යනු පතාගයේ නෝට්ටුවෙහි මුද්‍රණය කර තිබේ. අන් හැම නෝට්ටුවකම මිල ගණන දක්වෙනුයේ ද මේ ක්‍රමයෙනි. අද මෙන් මැදපු කඩදාසියක හොබනා ලෙස මුද්‍රිත නො වූ එම නෝට්ටුව හොර කාසි පතුරුවන්නන්ට සතර තතු හසළ සූරුවන් අතට එළැවූ හෝඩිකොළයක් වැනි වී. හොර නෝට්ටු අධික වන්නට විය. ආණ්ඩුව අලුත් නියෝග පනවා ඊට පිළියම් යොදන්නට පටන්ගති.

දෙයිතු 4 ක් තුට්ටුවකට ද තුට්ටු 4 ක් පණමකට ද පණම් 12 ක් හෙවත් රිදී 5 ක් පතාගයකට ද වටිනාකමෙන් සම විය. මෙය යැ එකල පැවැති මුදල් ක්‍රමය. ලංකාවෙහි කාසි අච්චුගැසුණු පළමුවන කායශාලය 1781 දී කොළඹ කයිමන් දොරකඩ අසල පිහිටැවිණ. 1783 දී ගාල්ල, යාපනය, ත්‍රිකුණාමලය යන තන්හි තවද කායශාලයයෝ පිහිටුවන ලදහ.

## ඉංගිරිසි යුගය

ඉංගිරිසිහු ඕලන්දයන් සතුව තුබුණු මුහුදු බඩ පළාත් 1796 දී අල්ලා ගෙන අවසාන යුගයට අතපොත් තැබූහ. ඕලන්දයන් ඉංගිරිසිනට කොළඹ පාවාදීමේදී කැරුණු ගිවිසුමේ හවන වගන්තියෙන් එකල ලකැ පැතිරැ තුබුණු ඕලන්දයනට අයිති රන් පවුම් 50,000 කට වැඩි නොවන ගණනක නෝට්ටු සඳහා මුද [illegible] ගැවීමට ඉංගිරිසින් භාරගත් බව ප්‍රකාශ වේ. ඉංගිරිසින් මෙරටට ගෙනා පළමුවන කාසිය **තාරකා පගෝඩිය** නම් රන් කාසිය යැ. එය මදුරාසියේ භාවිත වූවකි. ගනුදෙනුයෙහි යෙදුවුණු පළමුවන ඉංගිරිසි කාසිය වශයෙන් නම් ගැනෙන්නේ අනිකකි. උඩපැත්තේ එක්සත් පෙරදිග ඉන්දියානු සමිතිය යන අදහස සහ නිකුත් කැරුණු වර්ෂයද

යට පැත්තේ ඔවුන්ගේ සමාගමයෙහි සලකුණ සහ වටිනාකමද දක්වෙන තඹ කාසියකි ඒ. 1794, 1797 කාලයන්හි අච්චුගැසුණු මද්‍රාසි රුපියලකට 48 කින් සමවන කාසියක්ද 96 කින් සමවන කාසියක් දැයි එහි කාසි දෙවර්ගයක් විය.

උඩපැත්තෙහි තුන්වන ජෝර්ජ්රජුගේ හිසද යටපැත්තෙහි ඇත් රූපය, වටිනාකම සහ වර්‍ෂය ද, සටහන් වන තුට්ටු දෙක, තුට්ටුව, සහ තුට්ටුභාගය 1815 දී ද, උඩපැත්තේ ඇත් රූපය ද නිපන් වර්‍ෂය ද යටපැත්තෙහි ලංකාංඩුව යන අදහස පළවන පාඨය ද සටහන් වන වටිනාකම පතාගයකට 48, 96, 192 යන ගණන් වලින් සමාන වන කාසි 1801-1804 අතර ද එංගලන්තයෙහි අච්චුගස්වා මෙ රටට ගෙනෙනු ලැබූ තඹ කාසිය. උඩුපැත්තේ සිවු වන ජෝර්ජ් රජුගේ හිස ද යටපැත්තේ ඇත්රූපය හා ලංකාවේ පතාගය යන ඉංගිරිසි පාඨයද සටහන් රිදී කාසියක් ද 1821 දී එංගලන්තයෙහි අච්චුගස්වා මෙහි ගෙනෙනු ලැබිය. උඩු පැත්තේ ඇත්රුව සහ මුද්‍රිත වර්‍ෂයද යටපැත්තෙහි ලංකාංඩුව යන ඉංගිරිසි පාඨය සහ තුට්ටු ක්‍රමයට අගයද සටහන් 1801-1809 කාලයෙහි අච්චු



තුට්ටු 96 රිදී කාසිය
(ඉංගිරිසි)

ගැසුණු රිදී කාසියක් බහුලව පැතිරිණ. 12, 24, 48 යන අංක සඳහන් තඹකාසි තුනක්ද ඒ පවුලට අයිති විය. පතාගයකට ඒ එක් එක් වර්ගයෙන් සමවන කාසි ගණනය එම අංකයන්ගෙන් හැඟැවෙන්නේ 1802 වන තුරුම ඉංගිරිසි රජයේ පොත්වල තාරකා පගෝදි ක්‍රමය අනුව කළ ගණන් තැබීම ලංකාවේ පළාත් 1802 ජනවාරි 1 දින විදෙශභාර මහාලේකම් තුමාගේ පාලනය යටතට පැමිණීමත් සමඟම පතාග ක්‍රමයට කැරෙන්නට පටන් ගැනිණ. හොරකාසි අච්චු ගසන්නන් ඉංගිරිසි කාසියද දඬමීමා කරගත් හෙයින් ඔවුනට දඬුවම් පැමි[illegible]ට බරපතල නීති පනවන්නටද ඔවුන්ගේ නෝට්ටු එකතු කර ගෙන නැවැතත් රාජකීය භාංඩුවක් ඇතිව පතළ කරන්නටද ඉංගිරිසිනටත් සිදුවියැ. 1825 මාර්තු මස 25 වන දින කළ නියෝගය කින් පවුම් සිලිම් පැන්ස ක්‍රමය ලංකාවේද වලංගු කරන ලදී. එම ක්‍රමය අනුව 1821 දී නිකුත් කළ පතාගය සි. 1 පැ. 6 කට මිල නියම කළහ. 1872 ජනවාරි 1 වන දිනැ රුපියල් ශත ක්‍රමය වලංගුවීමෙන්

ශත 5, 1, $\frac{1}{2}$ යන කාසි ද එම අවුරුද්දේ සැප්තැම්බර මස 14 වන දිනැ සිට ශත $\frac{1}{4}$ කාසිය ද යන තඹ කාසි ප්‍රචාරයට වනි. 1891 පටන් ශත 50, 25, 10 යන රිදී කාසිද බෝවන්නට විය.

**මහ ශත පහ** නමින් හැඳිනි ශත 5 හේ වටකුරු තඹ කාසිය 1909 සැප්තැම්බර මස 13 වන දින සිට සුදු ලොහයකින් තැනුණු සතරැස් කාසියක් බවට පෙරළිණි. පැසුළු රුපියලේ කාසිය වෙනුවට නොහොට්ටුවක් හා රුපියල් දෙකට අභිනවතම නොහොට්ටුවක් හා පහළවීමෙන් ඉංගිරිසි මූල්‍යයන්ගේ නූතන විපරිණාමය පළ කෙළේ යැ. රුපියල් ශත ක්‍රමයෙන් පසුවැ ඇති වූ යටකී අතෝරය නට හසුවෙමින් පැවත ආ කාසින් සමඟ අද අප අතරැ භාවිත වන රු: 1. 2. 5. 10. 50. 100 යන ක්‍රමයෙන් මිල නැඟෙන නොහොට්ටු මිලත් ශත 50, 25, 10, 5, 1, $\frac{1}{2}$ යන ක්‍රමයෙන් මිල බැසෙන ලෝහ කාසිත් අපේ පැරැණි කාසිවල අවසාන දසාව යැ.

ඉතා දික් ඉතිහාසයක් ඇතිවැ සිය ඊශ්වරයන් සමඟම වැළැලී පවතින කාසිය කාලය නමැති කටු ළැහැබින්ද වැසුණේ වේ. කලින් කල අනාවරණය කර ගෙන විශෙෂඥයන්ගේ අතෝරයට හසුකර ගත් කාසි ස්වල්පය හැර තවද බොහෝ කාසි සිය රජුන්ගේ සිරුරු සමඟම පස්වෙමින් පවතින බවට සැක නැති. නරලොව සතුනට පිටු වහල් වන්නට ජරාවෙසින් පැමිණෙන ශක්‍රයන් මෙන් සුදුසු ගෞරව නො ලැබැ කාලයත් සමඟම ජරාවට පත්වැ අප අතරට පැමිණ තිබෙන සමහර කාසියකින් කාසින්ගේ සනාතනිය මෙසේ මෙසේ වීයැ යි අග මුල නො සිඳ දැක්වීම ඉතා පරිස්සමින් කළ යුත්තෙකි. එය ග්‍රන්ථයක් ලියාමයැ පැහැදිලි කළ යුතු. පැරැණි කාසි ගැන තත්ත්වඥයෝ විදෙශීන් අතරැ නම් දින පතා බෝ වෙති. එහෙත් අප අතරැ සිටින එවැන්නන්ගේ ගණන අතේ ඇඟිලි ගණනටවත් සීමා කළ නො හැකිය යනු තවද වචනයක් නො ඇවෙක්සෙන්නකි. කාසි සහ මුදල් ව්‍යවහාරය පිළිබඳ ඉංගිරිසියෙන් ලියැවුණු පොතක් ඇතද සිංහලයෙන් ලියැවුණු පොතක් මේ වනතුරුම පහළ නොවීම පුරාණ කාසි ගැන සැලැකිල්ල දක්වන්නන් අපරටැ විරල වීමට එක් හේතුවක් සේ ඇරැ පැහැකිය. ඒ පාඩුව පිරිමසා ලිමට [illegible]ෂිතෙහි කලක සිට ලියලවන බලාපොරොත්තුවක් වෙයි. මේ [illegible] අංකුර අවස්ථාවකි. කාසි පරපුර ගැන නූතන අවබොධයක් මෙවැනි ලිපියකින් ඇතිකරලීම ඉතා උගහටය. එය එසේ වුවද කාසිය පිළිබඳ සැලැකීමට පළමු කොට ආධුනිකයන්ගේ සිත් යොමු කැරැවීම මැනැවැ යි සිතූ අපි මේ ලිපිය ලිවීමෙහි උත්සාහවත්වූමු. සියලු කරුණු හකුළුවා දක්

වූණ ද කාසි පිළිබඳ සම්පූර්ණ විස්තර ඇරැ දක්වෙන ප්‍රතිරූප වලින් ප්‍රයෝජනය නො අඩුව ලබාදීමට අදහස් කොට එසේ කෙළෙමු. කවරකුට වුවද මෙයින් යම්තම් හෝ වැඩක්වේත් නම් එයම අපගේ සතුටට ද කරුණු වන බව අවශාන වශයෙන් කියනු කැමැත්තමු.

මෙහි ඇතුළත් ප්‍රතිරූපයන් කොඩ්රිංටන් මහතුන්ගේ ලංකා වේ පැරණි කාසි සහ මිල මුදල් නමැති පොතින් හා කොළඹ කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනය කැරෙන කාසි ලේඛනය නැමැති පොතින් හා උපුටා ගන්නට අවසරය දෙමින් කොළඹ කෞතුකාගාරයෙහි අධ්‍යක්ෂයන් අපට උපෂ්ටම්භක වැ අනුග්‍රහ කළ බව ද මෙහි ලා කිය යුතුයැ.

සෑතර වැවේ වා!

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය